# ශ්‍රී ලාංකේය රූපවාහිනී මාධ්‍ය තුළ අන්තර්සංස්කෘතික සන්නිවේදනය ප්‍රවර්ධනය සඳහා ආගමික වැඩසටහන්වල දායකත්වය පිළිබඳ අධ්‍යයනයක්

*ඒ. ඒ. අයි. සී අමරසිංහ*[1]

මිනිසා සහ සන්නිවේදනය අතර අවියෝජනීය සම්බන්ධතාවක් පවතී. එසේ වන්නේ මිනිසාගෙන් තොර ව සන්නිවේදනයට පැවැත්මක් නොමැති නිසා ය. එහෙත් මිනිසා ද ඔහු ජීවත් වන්නා වූ ජන කණ්ඩායමේ වෙසෙන ජනතාවගේ ඇවතුම් පැවතුම්, ගති සිරිත්, චාරිත්‍ර වාරිත්‍ර සහ මානව සම්බන්ධතාවන් පදනම් කොට ගනිමින් සන්නිවේදනය ක්‍රියාත්මක වන්නේ ය. විවිධ මානව කණ්ඩායම් තුළ ගොඩ නැගුණු සංස්කෘතීන් ප්‍රකාශයට පත්වන්නේ සන්නිවේදනය මාධ්‍ය කොට ගනිමිනි. සංස්කෘතියේ ස්වභාවය, විවිධත්වය මත ඒ ඒ ජන කණ්ඩායමේ සන්නිවේදන ස්වරූප ද විචල්‍යයකට බඳුන් වේ. ගෝලීය වශයෙන් අන්තර් සංස්කෘතික සන්නිවේදනය වඩාත් සක්‍රීය ව සිදු වන සංහතික මාධ්‍යයක් ලෙස රූපවාහිනිය හඳුන්වාදීමට හැකි ය. රූපවාහිනියට පැවරෙන සංස්කෘතික කාර්යය හේතුවෙන් ගෝලීය වශයෙන් පමණක් නො ව  බහු වාර්ගික සංස්කෘතික පසුබිමක් සහිත අප වැනි රටක් තුළ එක් එක් වාර්ගික සංස්කෘතීන් අතර අන්තර් සංස්කෘතික සන්නිවේදනය වඩාත් සාර්ථක ව සිදු කළ හැකි මාධ්‍යයක් බවට රූපවාහිනිය පත් වේ. බහු ජනවාර්ගික සංස්කෘතික සමාජයක් තුළ තම සමාජයේ එකිනෙක ජනවර්ගයට අයත් සංස්කෘතික වටිනාකම් සහ හරපද්ධතීන් ජනතාවට හඳුනාගැනීමට ඒවා වඩාත් ආකර්ෂණීය අන්දමින් සන්නිවේදනය කළ හැකි මාධ්‍යයක් බවට ශ්‍රව්‍ය හා දෘශ්‍ය සන්නිවේදනය පදනම් කරගත් රූපවාහිනියට හැකි වී ඇත. මෙරට බහුවාර්ගික සංස්කෘතික විවිධත්වයන් තුළ ආගමික ප්‍රපංචය ගත් විට එය සංකීර්ණ ස්වරූපයක පවතී. බෞද්ධ, හින්දු, ඉස්ලාම් සහ කතෝලික දහම මූලික ව අදහන මෙම සමාජයන් තුළ ඒ ඒ ආගමික ක්‍රියාවලීන් නිසි සන්නිවේදනයකට හසු කරවීම උදෙසා රූපවාහිනී මාධ්‍යය කෙබඳු දායකත්වයක් ලබා දෙයි ද  යන ගැටලුව මෙහි දී අවධානයට යොමු කරන ලදී. ඒ අනුව රාජ්‍ය හා පෞද්ගලික  රූපවාහිනී නාලිකාවන් ද්විත්වයකට විශේෂිත ව 2022 වර්ෂයේ විකාශිත වැඩසටහන් සහ අදාළ විකාශන කාලය, ප්‍රේක්ෂකයාගේ රුචිකත්වය යන කාරණාවන් පිළිබඳ නිරීක්ෂණාත්මක, අන්තර්ගත සහ සමීක්ෂණ භාවිත පර්යේෂණයක මෙහි දී නියුතු විය. ආගමික පසුබිම මූලික ව බෙහෝ වැඩසටහන් ආකෘති මෙන් ම විශේෂ ආගමික දින අනුව වැඩසටහන් සැකසීම පැහැදිලි වේ. එහෙත් මෙහි දී අන්තර්සංස්කෘතික හුවමාරුව උදෙසා විවිධ ආගමිහී දායකත්වය යම් යම් වැඩසටහන්වල ඌන සහභාගීත්ව ස්වරූපයක් පවතී. මෙම පර්යේෂණයේ දී අන්තර්ආගමික සහභාගීත්වය තවදුරටත් පැවතිය යුතු බව අනාවරණය විය. රූපවාහිනිය තුළින් සිදුවන අන්තර් සංස්කෘතික සන්නිවේදනය මඟින් ලෝකයේ විවිධ අනන්‍යතාවන් සහිතව ජීවත් වන්නා වූ විවිධ ජාතීන්, විවිධ ජන කොටස් ඒකීය සමස්තයක් ලෙස ඒකාබද්ධ කිරීම වර්තමානය වන විට සිදුකරන අන්දම ද හඳුනාගත හැකි වේ.

***ප්‍රමුඛ පදඃ*** අන්තර්සංස්කෘතික සන්නිවේදය, රූපවාහිනිය, ආගමික සහජීවනය, ජනවාර්ගිකත්වය

[1] කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී පාලි මණ්ඩපය, aaishanthiamarasinghe@gmail.com